GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

**2014.07.31**

**මාධ්‍ය නිවේදනයයි.**

අප සංගමයේ නිළවරණ කමිටුව උසාවි නියෝග දෙකටම අවනත වී තිබියදිත් , වැරදි සහගත ලෙස උසාවියට කරුණු සඟවමින් උසාවියට අපහාස කිරීමේ චෝදනා වංක ලෙස ගොනු කර ඇත. මෙයට සම්බන්ධ වෛද්‍ය පිරිස 06.08.2014 වන දාට නියමිත නඩු තීන්දුව කෙසේ හෝ කල් දමා ගැනීමට ජාතික රෝහලේ රැස්වීමක් සංවිධානය කර තිබුණි. මේ සඳහා විශේෂඥ වෛද්‍යවරු අතලොස්සක්ද මෙහෙයවා ගෙන ඇති බව දක්නට ඇත. ඔුවුන්ගේ අවංක චේතනාව වූයේ උප සභාපති අපේක්ෂකයා වාරණය කර ගැනීම නම් එය දැනටමත් සිදු වී ඇත. නමුත් දැනට සිදු වී ඇත්තේ ඉන් ඔබ්බට ගොස් සංගමය අකර්මන්‍ය කිරීමට හැකි සෑම උත්සාහයක්ම යොදවා අකර්මන්‍ය කාලය දීර්ඝ කිරීමට පියවර ගැනීමයි. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සංගමය තුල පත්වූ නිළ කණ්ඩායමට ලබා දුන් වාරණය තුළින් දැනටමත් සංගමය සම්පූර්ණයෙන්ම අකර්මන්‍ය වී ඇත. වෛද්‍ය ලියාපදිංචිය ඉල්ලූ ඇපෝතිකරීවරුන් උසාවියේ පැවරූ නඩුවට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ නිසා එය වෛද්‍යවරුන්ට අවාසි සහගත වී ඇත.

මේ වන විට උසාවියට ගොනු කර ඇති හෙද වින්නඹු අවුලට අප සංගමයට අවතීර්ණ වීමට නොහැකිව ඇත. 06 වෙනිදාද වාරණ නියෝගය දික්කිරීමේ වෑයම ක්‍රියාත්මක කළහොත් එම නඩුවටද ප්‍රසව හා නාරිවේද වෛද්‍ය මතය ඉදිරිපත් කිරීමට අපට නොහැකි වනු ඇත. විශේෂඥ වෛද්‍යවරු ඇතුළු සියලුම වෛද්‍යවරුන්ගේ 2015 වසරේ ස්ථාන මාරු විධිමත් කර රටේ සෑමට සමානව වෛද්‍ය සේවා ව්‍යාප්ත කිරීමට අප සංගමය ගෙන යන වැඩ පිළිවෙල අකර්මන්‍ය වී ඇත. 2015 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල සියල්ලම දැනට අකර්මන්‍ය වි ඇත. මේ හේතුවෙන් මාරුවීම් ලබන වෛද්‍යවරුන්ගේ දරුවන්ට විදුහල් සඳහා අයදුම් කිරීමද ව්‍යාකුල වනු ඇත .

DCD විෂවීම නැවත මතු වී ඇති අවස්ථාවක අපට නිහඬව සිටීමට සිදු වී ඇත. කෘෂි රසායන වලින් වැළඳෙන පිළිකා, වකුගඩු රෝග වලින් මහජනතාවත් අනාගත දරු පරම්පරාවත් බේරා ගැනීමට ඉතාමත්ම පුළුල් ලෙස විග්‍රහ කර යෝජනා 12ක් ඉදිරිපත් කළ අපට අද ඊට දායකත්වයක් දිය නොහැකි තත්ත්වයක් උදා වී ඇත. අප කළ යෝජනා 12 ඔස්සේ විවිධ සාකච්ඡා මඟින් ගන්නා ප්‍රතිපත්ති තීරණ වලට අපට දායකත්වයක් දැක්වීමට නොහැකි වනු ඇත.

නීතිඥයන් මඟින් ඉදිරිපත් වී ඇති වෛද්‍යවරු විවිධ දේශපාලන පසුබිම් වලට සම්බන්ධ බැවින් මෙම සිද්ධිය දෙස පිටත සිට බලන අයෙකුගේ අප්‍රසාදයට හේතු වනු ඇත. දේශපාලනයෙන් තොරව ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරමින් ජාතික වශයෙන් දායකත්වයත් සපයන අප සංගමයට එල්ලවී ඇති තත්ත්වය සම්බන්ධයෙන් නිර්මාණය වන්නේ අසතුටුදායක ප්‍රතිරූපයකි.

ස්තුතියි,

වෛද්‍ය චන්දික එපිටකඩුව
මාධ්‍ය අනු කමිටුව,

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය චන්දික එපිටකඩුව | 0718609961 |
| | වෛද්‍ය ප්‍රසාද් රණවීර | 0773527476 |
| | වෛද්‍ය විපුල ඉන්ද්‍රලාල් | 0717368142 |
| | වෛද්‍ය හරිත අලුත්ගේ | 0718121619 |
| | වෛද්‍ය අමිල මදුරාගොඩ | 0773553186 |